FACULTY OF GRADUATE STUDIES
RECEIVED
11 JUN 2013
UNIVERSITY OF KELANIYA

# මහනුවර යුගයේ කුල ක්‍රමය

# 2010

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 815 |
| වර්ග අංකය: | |

ඩී.ආර්.එච්. බටුගෙදර

FGS/ARCH/MC/08/001

පුරාවිද්‍යාව

සමාජීය විද්‍යාපති උපාධිය

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය

# සාරාංශය

මහනුවර යුගයේ කුල ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරනු ලබන මෙම නිබන්ධනයෙන් මුලින්ම කුලය යනු කුමක්දැයි විග්‍රහ කෙරේ. අනතුරුව කුලය පුද්ගලයාට උපතින්ම උරුම වන ආකාරයත් ඒ තුළින් මහනුවර යුගයේ සමාජ සංස්ථාව ඉතා සියුම් ලෙස පාලනය කළ ආකාරයත් විස්තර කෙරේ. එමෙන්ම ප්‍රධාන කුල පිළිබඳවත් , ඒවා අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳවත්, ඒ ඒ කුල වලට උරුම වූ රැකියා පිළිබඳවත් විස්තර කෙරේ. එමෙන්ම මෙම කුල බලපෑමට අනුව මහනුවර යුගයේ සමාජය විවාහ වූ ආකාරය හා විවාහ චාරිත්‍ර ඉටු කළ ආකාරය විමර්ශනයට ලක් කර ඇත. තවද කුලයට අනුව මහනුවර සමාජයේ පුද්ගලයන් ඇඳුම් පැළඳුම් භාවිතා කළ ආකාරය ද සාකච්ඡා කොට ඇත. එහිදි රටේ ප්‍රධාන පුරවැසියා වන රජුගේ පටන් සාමාන්‍ය ජනයා දක්වාම සාකච්ඡා කෙරේ. තවද කාන්තාවන් මහනුවර යුගයේ දී වස්ත්‍රාභරණ පැළඳි ආකාරය මහනුවර යුගයේ කුල ක්‍රමය පැහැදිලි කරන තවත් සාධකයකි. එමෙන්ම මෙබඳු වූ කුල ක්‍රමය මහනුවර සමාජය පුරා පැතිර පැවතුන ද යුරෝපීය ආභාෂයත් සමඟම සිදු වූ කුල පරිහානිය මෙහි දී විමර්ශනයට ලක් කර ඇත. එහිදී කුල සම්ප්‍රදායෙන් මිදුණ නව වස්ත්‍රාභරණ විලාසිතා පිළිබඳව සාකච්ඡා කෙරේ. අවසාන වශයෙන් මෙයින් කියනුයේ මහනුවර යුගයේ බිතුසිතුවම් තුළින් හෙළිවන යුරෝපීය ආභාසයට හසු වූ කුල ක්‍රමයේ පරිහානියයි.

තවද කුලය යන්න මහනුවර සමාජය තුළ ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදුනු අයුරු විග්‍රහ කෙරේ. එනම් කුලීන හා කුලහීන වශයෙනි. මෙම ප්‍රධාන කොටස් දෙකට අයත් වූ කුල බොහොමයක් විය. ඒ සියල්ල මහනුවර යුගයේ දී . රජය විසින් සුරක්ෂිත කොට පාලනය කොට ස්ථාවර කරන ලද නිල ක්‍රමයක් බඳු විය. එමෙන්ම මෙය රජයේ ආර්ථික ව්‍යුහයේ අත්තිවාරම ද විය. අඩු කුලයේ අය ඉහළ කුල වලට සේවාකම් කළහ. රාජකාරී කළහ. ඉහළ කුලය සම්මාන සැලකිලි, ගරු, නම්බු මෙන්ම ද්‍රව්‍යයමය වාසි ලබමින් සැප සේ විසුහ. මේ අනුව කුල වලට අනුපිළිවෙළක් හෝ ධුරාවලියක් ස්ථිරවම නොමැති වුවත් උසස් පහත - යැයි පිළිගත් සම්මතයන් විය. මේ අනුව මහනුවර යුගයේදී දක්නට ලැබුණු කුල කිහිපයක් නම් රදල, මුදලි, රටේ ඇත්තන් , ගොවිගම, ආචිරි, බඩහැල, බෙරවා, දුරයි. හාලි, කරණවෑම්, පදුවන් , කරාවේ, හකුරු, හන්නාලි, කින්නර , රා මදන්නන්, හුන්නන්. යමන්නු, පලීන්, ගත්කරු නෑදයෝ, දඹවැදි, පන්නයින්, රොඩි ආදියයි. මේ අනුව බැලිමේදී මහනුවර යුගයේ කුල සංස්ථාවේ සංකීර්ණ ස්වරූපය වැටහේ. එම සංකීර්ණ සමාජය විනිවිද දැකීමට මෙම නිබන්ධය වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.